# ස්ත්‍රී නිදහසඃ නූතන ස්ත්‍රීවාදය සහ බෞද්ධ ස්ත්‍රී විමුක්තිය ආශ්‍රිත තුලනාත්මක විමර්ශනයක්

පූජ්‍ය, කේ. සුගුණධම්ම හිමි[1], කේ. එම්. නයෝමි මධුපාණි[2]

**හැඳින්වීම**

නූතන ස්ත්‍රීවාදී සඞ්කල්පය (Feminism) 18 සහ 19වන සියවස්හි යුරෝපය කේන්ද්‍ර කරගෙන බිහි වූවකි. මුල් කාලීන ඇමරිකානු ස්ත්‍රීවාදීන් 'පිරිමින්ගෙන් නිදහස් වීම' යන තේමාවෙන් මෙම ව්‍යාපාරය ආරම්භ කර ඇත. පසුව මෙම ස්ත්‍රීවාදී අදහස සමාජභාවය, දේශපාලනය, අධ්‍යාපනය, සංස්කෘතිය සහ කුටුම්බය යනාදියෙහි පුරුෂයාට සාපේක්ෂ වූ අධිකාරීත්වයක්, ස්වාධීනතාවක්, සමානතාවක් මෙන් ම අයිතාවාසිකමත් විෂයයෙහි පැතිරී ගියේ ය. ස්ත්‍රී විමුක්තිය යුරෝපයෙහි ඇති වූයේ 18වන සියවසේ වුවත් එය ප්‍රාචීන සන්දර්භයෙහි ආචීර්ණ කාල්පික අදහසකි. මාතෘ මූලික සමාජයක් වූ ඉන්දියාවෙහි වෛදික යුගයේ සිට පැවතුණේ පුරුෂෝත්තමවාදයකි. එය බ්‍රාහ්මණ සමාජයේ දී උත්සන්න වූ අදහසක් විණි. ක්‍රි.පූ. 6/5 සියවසෙහි ඇති වූ බෞද්ධාගමික පුනරුදයත් සමඟ සමාජයෙහි සියලු මනුෂ්‍ය ප්‍රජාව වෙත සාධාරණීය පිළිවෙතක් සකස් වුණි. එහිදී ස්ත්‍රිය විෂයයෙහි ද ප්‍රගතිශීලී එළැඹුමක් බුදුදහමෙන් හිමි වූ බව හඳුනා ගත හැකි ය. බුදුදහම ආශ්‍රිත විවිධ සූත්‍ර සහ ථෙරීගාථා ආදියෙන් ඒවා හඳුනා ගත හැකි ය. නූතන ස්ත්‍රීවාදී කතිකාවට සමාන්තර අදහස් කිහිපයක් බෞද්ධ ස්ත්‍රී විමුක්තියෙහි සාකච්ඡා වන බව පෙනේ. මෙම කතිකා දෙකේ ම උත්කර්ෂයට නැංවෙන මූලික අදහස වන්නේ ස්ත්‍රී නිදහස යි. නූතන ස්ත්‍රීවාදය ස්ත්‍රිය විෂයයෙහි සාකල්‍ය නිදහසක් හා ස්වාධීනතාවක් අත්පත් කරගන්නට උත්සාහ කරන ව්‍යාපාරයකි. ඇතැම් විට නූතන ස්ත්‍රීවාදී අදහස් අභිභවන තරම් බෞද්ධ ස්ත්‍රී විමුක්තික අදහස් ප්‍රගතිශීලී ය. බෞද්ධ ස්ත්‍රී විමුක්තියෙහිත් බටහිර නූතන ස්ත්‍රීවාදී කතිකාවෙහිත් ස්ත්‍රී නිදහස සාකච්ඡා කර ඇති ආකාරය තුලනාත්මකව විමර්ශනය කිරීම මෙහි දී සිදු කෙරේ.

**පර්යේෂණ අරමුණ**

මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ බටහිර නූතන ස්ත්‍රීවාදී කතිකාවේ සහ බෞද්ධ ස්ත්‍රී විමුක්තික කතිකාවේ ස්ත්‍රී නිදහස සාකච්ඡා කර ඇති ආකාරය විමර්ශනය කිරීම යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාලායාදියෙන් ලබාගන්නා තොරතුරු, දත්ත විශ්ලේෂණාත්මක විධික්‍රමය ඔස්සේ සිදු කෙරිණි.

**පර්යේෂණ ගැටලුව**

බටහිර නූතන ස්ත්‍රීවාදයේ සහ බෞද්ධ ස්ත්‍රී විමුක්තියෙහි 'ස්ත්‍රී නිදහස' සාකච්ඡා කරන්නේ කවරාකාරයෙන් ද?

[1]. තාවකාලික කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. *Sinhalasuguna@gmail.com*
[2]. තාවකාලික කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. *nayomimadhupani317@gmail.com*

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

ලතා ගුරුසිංහගේ **සාහිත්‍යය මැවූ ගැහැනිය** නමැති කෘතියේ දී ස්ත්‍රීවාදී කතිකාව පිළිබඳ සාකච්ඡා කොට ඇත. එහි දී බුදුදහමේ ස්ත්‍රීත්වය නිරූපණය කොට ඇති ආකාරය පිළිබඳ අදහස් දක්වා ඇතත් නූතන බටහිර ස්ත්‍රීවාදය හා බුදුදහමේ ස්ත්‍රී නිදහස සාකච්ඡා කරන්නේ කෙසේ ද යන්න තුලනාත්මක ව විමර්ශනය කොට නැත. ඉන්ද්‍රානි පෙරේරාගේ **කාන්තාව සහ බුදුසමය** කෘතියේ දී ජාතකකථා ආශ්‍රිත ව ස්ත්‍රීත්වය නිරූපණය කොට ඇතත් ඒවා නූතන ස්ත්‍රීවාදී කතිකාව හා සසඳමින් විමර්ශනය නො කෙරේ. සුචරිත ගම්ලත්ගේ **මනමේ නාට්‍ය සේවනය** කෘතියේ දී ජාතක පොතෙහි ස්ත්‍රීත්වය නිරූපණය කොට ඇති ආකාරය සාකච්ඡා කර ඇත. සුචරිත ගම්ලත්ගේම **සුබස් මිණි ආර** කෘතියේ දී පුරුෂෝත්තමවාදය පිළිබඳ වෛදික හා බටහිර මතවාද පිළිබඳ සඞ්ක්ෂිප්ත ව සාකච්ඡා කර ඇත. රඹුක්වැල්ලේ විපස්සී හිමියන්ගේ **ථෙරීගාථා** කෘතියෙහි ප්‍රස්තාවනාවෙහි බ්‍රාහ්මණ සමාජයේ හා බුදුදහමේ ස්ත්‍රිය නිරූපණය කොට ඇති ආකාරය සාකච්ඡා කොට ඇත. මේ කෘතිවල නූතන ස්ත්‍රීවාදයේ සහ බෞද්ධ ස්ත්‍රී විමුක්තික අදහස්වල ස්ත්‍රී නිදහස සාකච්ඡා කරන්නේ කෙසේ ද යන වග තුලනාත්මකව සාකච්ඡා කර නැත.

**පර්යේෂණ සීමා**

මෙම පර්යේෂණය ථෙරවාද සූත්‍රාගත තොරතුරු සහ ථෙරීගාථාපාළියටත්, නූතන ස්ත්‍රීවාදී සඞ්කල්පවලටත් පමණක් සීමා වේ.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල සහ පර්යේෂණ නිගමනය**

ඓතිහාසික ලේඛන පරීක්ෂා කරන විට පෙනී යන්නේ ඉතිහාසයෙහි ස්ත්‍රිය ආන්තීකරණයට ලක්ව ඇති බව යි. ඉතිහාස අලේඛනය පුරුෂකේන්ද්‍රීයය. එහෙයින් ස්ත්‍රීන්ගේ ඉතිහාසය ස්ත්‍රීන් විසින් ම සොයාගත යුතුය යන අදහස මුල්කාලීන ස්ත්‍රීවාදීන්ගේ අරමුණුවල තිබිණි. ලෝක මනුෂ්‍ය ජනගහනයෙන් හරි අඩක් පමණ සිටින්නෝ ස්ත්‍රීහු ය. එහෙත් ඔවුන්ට නිසි මනුෂ්‍යත්ව සහ ප්‍රජාතන්ත්‍රීයතාව හිමි වී ඇති ද යන කාරණය සාකච්ඡා කිරීමට ඓතිහාසිකව දාර්ශනිකයන්, ප්‍රගතිශීලී චින්තකයන් සහ විචාරකයන් පෙළ ගැසී සිටින බව පෙනේ. ස්ත්‍රී මනුෂ්‍යයා සම්බන්ධයෙන් අනෙකා තුළ සානුකම්පික අදහස් ඇතිවීම ඉතිහාසයෙහි සිදු වූ වඩාත් සාධනීය කතිකාවකි. මේ එළඹුමෙහි මූලික හා උච්ච අවස්ථා භාරතීය සන්දර්භයෙහි ගෞතම සම්බුද්ධයන්ගේ ශාසනයෙහි දැකගත හැකි ය. 18වන සියවසේ සිදු වූ ප්‍රංශ විප්ලවයත් සමඟ ස්ත්‍රී නිදහස පිළිබඳ යුරෝපයෙහි ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය තුළ ම දැඩි කතාබහක් ඇතිවිය.

බටහිර නූතන ස්ත්‍රීවාදී කතිකාව ආරම්භ කිරීමෙහි පුරෝගාමී වූයේ Mary Wollstonecraft නමැත්තිය යි. ඇයගේ A Vindication of the Rights of Women නම් කෘතිය නූතන ස්ත්‍රීවාදයේ නිදහස් ප්‍රකාශනය ලෙස හඳුනා ගැනේ. අනතුරු ව Simone de Beauvoir ලියූ The second Sex කෘතියත් Olive schreiner ලියූ Woman and Labour කෘතියත් Virginia Woolf ලියූ A room of one's own කෘතියත් Sandra M. Gilbert and Susan Gubar ලියූ Madwoman in the attic කෘතියත් සහ තවත් අයගේ මැදිහත් වීමත් මඟින් නූතන ස්ත්‍රීවාදී අදහස් ව්‍යාප්ත විණි. ඉන්දියානු ලේඛිකා ගයත්‍රී ස්පිවැක් ද නූතන ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ප්‍රධාන තැනක් ගනී. මොවුන්ගේ විවිධාකාර එළැඹුම්වලින් පැන නැඟුණු නූතන ස්ත්‍රීවාදය

ලිබරල් ස්ත්‍රීවාදය, මාක්ස්වාදී ස්ත්‍රීවාදය, රැඩිකල් ස්ත්‍රීවාදය, පශ්චාත් නූතන ස්ත්‍රීවාදය, පරිසර ස්ත්‍රීවාදය සහ කළුජාතික ස්ත්‍රීවාදය ආදි වශයෙන් විවිධ දිශානති ඔස්සේ පැතිරුණු ආකාරය දැකගත හැකි ය. මෙම ස්ත්‍රීවාදී ව්‍යාපාර යම් යම් ස්වාධීන අදහස් දැරුව ද, පොදුවේ ගත් විට ස්ත්‍රිය මනුෂ්‍යයෙකු වශයෙන් සමාජයට ඌනනය කරමින් ස්ත්‍රී නිදහස ම උත්කර්ෂයට නංවන ආකාරයක් දැකගත හැකි ය. ස්ත්‍රීවාදීන් මූලික ව ම පවසන්නේ පිරිමින්ගෙන් නිදහස් වීම යන අදහස යි. පිරිමි කේන්ද්‍ර කරගත් දේශපාලනය තුළ, ඉතිහාසය තුළ, සංස්කෘතිය තුළ, අධ්‍යාපනය තුළ, අයිතිවාසිකම් තුළ, පවුල තුළ, රැකියාව තුළ, ශ්‍රමය තුළ, ශක්‍යතාව තුළ භාෂාව තුළ, ලිංගිකත්වය තුළ, සම්පත් හා ඒවාහි බෙදීයාම තුළ ඇති පිරිමි ආධිපත්‍යයෙන් නිදහස්වීම නූතන ස්ත්‍රීවාදයෙන් ඉදිරියට එන කරුණු වශයෙන් ගත හැකි ය. උක්ත පිරිමි ආධිපත්‍යවත් කිසිවක ස්ත්‍රියකට නිදහස් හා ස්වාධීන ලෙස කටයුතු කිරීමට අවකාශ නැතියෙන් නූතන ස්ත්‍රීවාදී කතිකාව ආරම්භ ව ඇත. ඈන් රොස්ලින්ඩ් ජෝන්ස් පවසා සිටියේ ස්ත්‍රී ඉරණම වනාහි අදෘශ්‍යමානී ව පෙරට නො පැමිණ සිටීම හා ගොළුව සිටින ජීවීන් බවට පත්වීම බව යි. එසේ ම ඔවුන් ස්ත්‍රිය පිළිබඳ කතිකාවේ දී Happyness and Liberty පිළිබඳ දැඩිව සාකච්ඡා කරයි. ස්ත්‍රියට හිමි සකල සංතෘප්ති සේ ම ඇයට සියලු නිදහස ද හිමි විය යුතු බව නූතන ස්ත්‍රීවාදීහු පවසති.

බෞද්ධ දර්ශනය තුළ බොහෝ විට මනුෂ්‍ය සමානතාව ඉහළින් අගය කරයි. දාර්ශනික චින්තාවක් වශයෙන් පමණක් නො ව එය ප්‍රායෝගික ව ද ගෞතම ශාසනයෙහි ක්‍රියාත්මක වන ආකාරය ත්‍රිපිටකාගත කරුණුවලින් පෙනේ. බුදුදහමෙහි සිවුවනක් පිරිස පිළිබඳ සංකල්පය ද එක සමාන බරකින් යොදා ඇත. සතර සංග්‍රහවස්තු පිළිබඳ විචාරයේ දී ද සමානතාව අනෙක් කරුණු ත්‍රිත්වය සමග ධුරාවලියක් ඇති නො වන සේ දක්වා ඇත. බුදුදහම තුළ ආගමිකත්වයෙන් හෝ ජාතිකත්වයෙන් විතැන් ව සියලු මනුෂ්‍යයාට නිදහස තිබිය යුතු ය යන කාරණය ඉහළින් සාකච්ඡා කරයි. බුදුදහම ජනප්‍රියත්වයට පත් කාලයේ දී මනුෂ්‍ය සමානතාව හෝ මනුෂ්‍ය පිළිගැනීම තිබුණ බවට ඓතිහාසිකව තහවුරු වන්නේ නැත. කුලීන සහ කුලහීන වශයෙන් ද ස්ත්‍රී-පුරුෂ වශයෙන් ද මනුෂ්‍යයා වර්ග කර තිබුණි. එහි දී ස්ත්‍රියට මනුෂ්‍යයෙකු වශයෙන් පිළිගැනීමක් (Recognition) සහ සම්පත් සම සේ බෙදීයාමක් (Re-Distribution) නො තිබුණි. අවම වශයෙන් බුදුදහම ජනතාව අතරට එන්නට පෙර ස්ත්‍රියකට මනුෂ්‍යයෙකු වශයෙන් වත් පිළිගැනීමක් තිබී නැති බවට මනුස්මෘතිය, හිතෝපදේශය, පංචතන්ත්‍රය වැනි සංස්කෘත උපදේශ ග්‍රන්ථවලින් දැකගත හැකි ය. එහෙත් බුදුරදුන් විසින් ස්ත්‍රිය තම ශාසනයෙහි සිවුවනක් පිරිසට ඇතුළත් කිරීමෙන් ස්ත්‍රී නිදහස ඇගයීමේ වඩාත් ප්‍රගතිශීලී පියවර තැබිණි. ඇය බුදුදහමේ උපාසිකාවක් බවට පත් වුණා ය. ඇයට සිය සිත දමනය කිරීමේ නිදහස හිමි විය. ගේදොර වැඩපලවලින් නිදහස් ව මොහොතක් ඇය වෙනුවෙන් ජීවත් වන්නට ඉඩහසර ලැබුණා ය. බුද්ධශාසනයෙහි ස්ත්‍රීන් පැවිද්ද ලබාගැනීම යම් අරගලයක ඵලයක් වුවත් එයින් සමස්ත ස්ත්‍රී ප්‍රජාවගේ ම විමුක්තිය තහවුරු වූ බව කිව යුතු ය. ථෙරීගාථාපාළිය පිරික්සීමෙන් පෙනී යන කාරණයක් වන්නේ එහි ස්ත්‍රීන්, රාජකුමාරිකාවන්, බ්‍රාහ්මණ කුමාරිකාවන්, සිටුදියණියන්, විවාහය ප්‍රතික්ෂේප කළවුන්, ගණිකාවන්, දාසීන්, වැන්දඹුවන් ආදීන්ගෙන් සමන්විත වූ බව යි. බෞද්ධ පැවිද්ද හේතුවෙන් මේ සියලු ස්ත්‍රීන්ගේ නිදහස ආරක්ෂා වූ බව කිව යුතු ය. විශේෂයෙන් පවුල තුළ ස්ත්‍රියක් වීම නිසා ඔවුන් විඳි විවිධාකාර මර්දන ථෙරීගාථාපාළියෙහි එයි. බුදුරදුන්

වදාරන්නේ ස්ත්‍රියක් වීම නිසා කාරකත්‍වයක් අහිමි නො වන බව යි. අඞ්ගුත්තරනිකායේ අට්ඨකනිපාතයෙහි ගොතමීවග්ගයෙහි ගොතමී සූත්‍රයෙහි දක්වන පරිදි,

**"ආනන්‍ද මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්‍වා සොත්පත්තිඵලම්පි සකදාගාමිඵලම්පි අනාගාමිඵලම්පි අරහත්තඵලම්පි සච්ඡිකාතුන්ති"**

ස්ත්‍රියට ද සෝවාන් මාර්ගයේ සිට අරහත් මාර්ගය දක්වා යාමේ නිදහස මෙන් ම හැකියාව ද පවතින බව එයින් පැහැදිලි වේ. සියලු තැන පුරුෂයාම ප්‍රධාන නො වන බවත් ස්ත්‍රිය ද ප්‍රධානත්‍වයට සුදුසු බවත් කුණ්ඩලකෙසීථෙරී අපදානයේ දක්වා ඇත. අඞ්ගුත්තරනිකායේ එකකවග්ගයේ දැක්වෙන පරිදි බුදුසසුනේ විවිධ ශාසනික තනතුරු පවා ප්‍රදානය කිරීමෙන් ස්ත්‍රී ස්වාධීනතාව බුදුදහමේ ස්ත්‍රී විමුක්තියට අදාළ බව කිව හැකි ය. පුණ්ණා සහ ඉසිදාසී ආදි ථෙරීගාථාහි දැක්වෙන පරිදි පැවිදි වීමට පෙර ඔවුන් විඳි කුටුම්බ හිරිහැර නිරූපණය වේ. චුල්ලවග්ගපාළියේත් අපදානපාළියේත් දීඝනිකායාදී සූත්‍රවලත් ස්ත්‍රී නිදහස (ස්ත්‍රී විමුක්තිය) පිළිබඳ බෞද්ධ අදහස් නිරූපණය කොට ඇත. බෞද්ධ සූත්‍රදේශනාවල සහ යම් සඞ්කල්පවල අගතිගාමී අදහස් නිරූපණය වුවත් ස්ත්‍රී නිදහස පිළිබඳ සැලකීමක් වත් නො වුණු සමාජයක බොහෝ ඉදිරිගාමී අදහස් බෞද්ධ ස්ත්‍රී විමුක්තියෙහි සාකච්ඡා වන බව කිව යුතු ය. විශේෂයෙන් නූතන ස්ත්‍රීවාදීන් පවා පවසන මනුෂ්‍යයෙකු වශයෙන් පිළිගත් සහ ඇයට හිමි විය යුතු මනුෂ්‍ය නිදහස බෞද්ධ විමුක්තයෙහි ද ගැඹුරින් සාකච්ඡා වන බව කිව යුතු ය. බෞද්ධ ස්ත්‍රී විමුක්තික අදහස් සහ නූතන ස්ත්‍රීවාදී අදහස් අප තේරුම්ගත යුත්තේ සන්‍දර්භගත ව ය. නූතන ස්ත්‍රීවාදීන් භාෂාවේ පවත්නා ධුරාවලිය හේතුයෙන් ස්ත්‍රී නිදහස අහිමි වන බව පවසා ඇත. 'සුරූපිනි', 'ලලනා', 'පතිනි, 'ප්‍රමදා' වැනි සංඥාර්ථ මඟින් ස්ත්‍රී නිදහස අහිමි වන බව නූතන ස්ත්‍රීවාදීහු පවසති. ස්ත්‍රී සිරුර ම ඉස්මතු කොට ඒ අනුව ස්ත්‍රී භාෂාව හැඳින්වීම නූතන ස්ත්‍රීවාදීන්ගේ විවේචනයට ලක්වේ. බෞද්ධ සූත්‍රාදිය පිරික්සීමෙන් පෙනී යන වඩාත් සියුම් කාරණයක් වන්නේ බොහෝ විට බුද්ධ ආමන්ත්‍රණයෙහි ස්ත්‍රිය 'මාතුගාම' (මව්ස්ත්‍රිය) යන සංඥාවෙන් පමණක් ම හඳුන්වා ඇති බව යි. නූතන ස්ත්‍රීවාදීන් පවසන්නේ ස්ත්‍රී-පුරුෂ යන ස්වාභාවික ලිඞ්ගික අනන්‍යතාව ද ස්ත්‍රී නිදහස පිළිබඳ සාකච්ඡාවේ දී බාධාවක් වන බව යි. ස්ත්‍රී ලිඞ්ගික හිඩැස නිසා ඔවුන් අර්ථකථනය වන්නේ නස්ත්‍යර්ථයේ ය. පුරුෂලිඞ්ගික ලම්බකත්‍වය හේතුයෙන් පුරුෂයන් අස්ත්‍යර්ථයේ නිර්වචනය වන බව නූතන ස්ත්‍රීවාදීහු පවසති. බුදුදහම තුළ **"ඉත්ථීභාවො කිං කයිරා"** වශයෙන් නඟන පැනය නූතන ස්ත්‍රීවාදීන්ගේ අදහසට සපුරා ම එකඟ නො වුණත් ඊට සාමාන්තර අදහසකින් එකඟ වේ. ජේන් ටොම්ප්කින්ස් සහ නැන්සි කේ මිලර් පවසන්නේ ස්ත්‍රී ආත්ම චරිතකතා ඔස්සේ ස්ත්‍රිය දෙස බැලිය යුතු බව යි. එයින් ඔවුන් පෙන්වා දෙන්නේ පිරිමි පක්ෂයේ ආත්මකතාවල ඔවුන් ගත් ක්‍රියාමාර්ගවල විශිෂ්ටත්‍වය, බුද්ධිබල මහිමය, ගැටලු නිරාකරණ ශක්තිය, මහජන ගෞරවය යනාදිය උත්කර්ෂයෙන් පෙන්වන අතර, ස්ත්‍රීමයත්‍වය දරුවන් වදමින් ලිඞ්ගික සංතෘප්තිය සපමින් සිටින උපයෝගීතාවෙන් තොර අය ලෙස දක්වා ඇති බව යි. බෞද්ධ විමුක්තික අදහස්වල මේ එළැඹුම ථෙරීගාථාවලින් දැකගත හැකි ය. ථෙරීගාථාවලින් එකල ස්ත්‍රීත්‍වය සම්බන්‍ධ බොහෝ කරුණු දැනගත හැකි ය. බෞද්ධ ස්ත්‍රී විමුක්තිය ස්ත්‍රී නිදහස අගය කරමින් ඇය මනුෂ්‍යයෙකු වශයෙන් පිළිගන්නා ආකාරය දැකගත හැකි ය. නූතන ස්ත්‍රීවාදය ඊට වඩා පුළුල් ආකාරයෙන් ස්ත්‍රී නිදහස අර්ථකථනය කරමින් සාකච්ඡා කරන ආකාරය දැකගත හැකි ය.

ප්‍රමුඛ පදඃ ස්ත්‍රී නිදහස, නූතන ස්ත්‍රීවාදය, බෞද්ධ ස්ත්‍රී විමුක්තිය, තුලනාත්මක විමර්ශනය

මූලාශ්‍රය


- **බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා.** (2006). නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- අතුකෝරල, පී. (2005). **නූතන දේශපාලන හා සමාජ න්‍යාය.** කර්තෘ ප්‍රකාශන.
- ගුරුසිංහ, ලතා (2017). **සාහිත්‍යය මැවූ ගැහැනිය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- දිසානායක, විමල් (2004). **නව විචාර සංකල්ප.** බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශනයක්.
- පෙරේරා, ඉන්‍ද්‍රානී (2000). **කාන්තාව හා බුදුදහම.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රණවීර, ආරියවංශ (2018). **බටහිර විචාරවිධි.** මහරගමඃ අහස මීඩියා වර්ක්ස්.
- Beauvoir, Simone de (2010). **The Second Sex**. (tr.). Constance borde and Sheila malovany-chevillier. New York: Vintage books.